# අමා දහරේ
# දශක නෘත්‍යාකර්ශණය






අමා සිරිවර්ධනත් අමා නර්තනායතනයත් මෙල්බන් නගරයට අමුතු හඳුන්වාදීමක් නෙමෙයි. අමා නර්තනායතනය මගින්, අමා සිරිවර්ධන නම් ඇය දස වසරක් පුරා ලාංකීක දුවා දරුවන්ට නර්තනය ප්‍රගුණ කරන ප්‍රවීන නර්ථනාචාර්යවරියක්. ලාංකීය නර්තනය යනු විදෙස් රටකදී නර්තනයක් පමණක් නොවෙයි. එය සංස්කෘතික විස්තාරණයක්. ඉන් ප්‍රකට වන අභිලාෂයන් තුළ තිබෙන්නෙ අපේකම, නොරට විත් අපේකම සොයා යන අපිට ඇය ගෙන එන්නේ යම් පමණ සහන ඔසුවක්. ඉන් අපිට අපි ගැන සිතන්න පහසු කරනවා. 'සන්නස' වෙනුවෙන් මා ඇය මුණගැසුනේ ඇගේ දසවස් පූර්ණය වෙනුවෙන් පැවැත්වෙන 'අමා දහර 2015 කාල යාත්‍රා' ප්‍රසංගය ගැන කරුණු කාරණා අසා දැනගන්න.

**ඇත්තටම අමා, ඔබ ඔස්ට්‍රේලියාවේ ලාංකීය නර්තනයන් ප්‍රචලිත කිරීමේ යෙදී සිටින්නේ දස වර්ෂයක පටන්. ඒ සඳහා ඔබ අමා දහර 2015 ප්‍රසංගය වේදිකාවට ගෙන එනවා. මේ ඔබේ ප්‍රථම ප්‍රසංගය නොවෙයි. ඔබ මීට පෙර ප්‍රසංග කීපයක්ම පවත්වා තිබෙනවා. මොකද්ද මෙවර ප්‍රසංගයේ සුවිශේෂත්වය ?**

කාල යාත්‍රා කියන්නේ අමා නර්තනායතනයේ තවත් අපූරු ප්‍රසාංගික ඉදිරිපත්කිරීමක්. දස වසරක සුන්දර අද්දැකීම් තමා මේකට කැටිවෙලා තියෙන්නෙ. දස වසරක් කියන්නේ පුංචි කාලයක් නෙමෙයිනෙ ශ්‍රීනාත්. 2004 පටන් අද දක්වා මගෙන් නර්තනය හැදෑරූ නර්තනවේදින්යන්, තවත් ඉදිරියට නර්තනය හදාරමින් සිටින නර්තනවේදිනියන්ගේ කුසලතාවන්ගෙ එකමුතුවක් මේ ප්‍රසංගය. නර්තන පාසැලක් ලෙස අප ලැබූ දියුණුවේ ප්‍රතිබිම්භයක් ලෙස මෙය හැඳින්වුවත් වැරදි නැහැ.

**අතීතානුස්මරණයෙන් අනාගතයට අවතීර්ණ වීමක් නර්තනාකූලව 2015 අමා දහර කාල යාත්‍රා තුළින් රසවිඳි හැකි බවයි ඔබ පවසන්නේ. හොඳයි, මේ ප්‍රසංගය අනෙකුත් ප්‍රසංග වලින් වෙනස්**



**වන්නේ කොයි ආකාරයටද ?**

අමා දහර ප්‍රසංගය විවෘත වේදිකාවක් නර්තන ලෝලීන්ට විවර කිරීම සුවිශේෂීයි. මෙයින් මා අදහස් කරන්නේ ඕනෑම නර්තන සම්ප්‍රදායක් රස විඳීමට කැමති නර්තන ලෝලීන්ට මෙය හොඳ අවස්ථාවක් කියලයි. ඒ කියන්නෙ අපි විවිධාකර්ශණීය අංග පෙලක් මීට එකතු කරල තියෙනවා. හැබැයි සම්ප්‍රදායට පමණක් සීමා නොවී විවිධාකාර වූ නර්තන සම්ප්‍රදායන් එකිනෙක හා සම්මිශ්‍රණය කරමින් අපගේ නර්තන අංගයන් නිමවී තිබීම විශේෂයි කියල කියන්නම ඕනෙ.

**කාල යාත්‍රා ප්‍රසංගයේ නර්තන පෙළගැස්ම කොයි ආකාරද අමා ?**

මම ඔබට මුලින් කී ආකාරයට නැවුම් ආකෘතියකින් නිර්මාණය කරල තියෙනවා. සාමාන්‍යයෙන් නර්තනාංගයකින් තවත් නර්තනාංගයකට අවතීර්න වන සම්ප්‍රදාය අපි බිඳ දැම්මා. සංකල්ප, සංසිද්ධි එක්කළ නර්තනාංග කිහිපයක සුසංයෝජනයක්. මම විශ්වාස කරනවා එවිට නර්තනයේ රස තව තවත් උද්දීපනය වෙනවයි කියල.

උදාහරණයක් ලෙස අතීත ලංකීය ජන සමාජය මූලික කරගත්, එහි ජීවන රටාව, ඇදහිලි, විශ්වාස, දෛනික ජීවිතයේ රසමුසු තැන් නර්තනාකූලව පෙලගස්වා වේදිකාවට ගෙන එනවා. මේ සඳහා සාම්ප්‍රදායිය නර්තන, ඉගිනළු, අභිනයන් වැනි දේ මම භාවිතා කළා.

**මම ඇහැව්වොත් මේ අපූර්රත්වයේ අභියෝගය ඔබ ජයගත්තේ කොයි ආකාරයෙන්ද කියලා..**

පිටපත, සංගීත නිර්මාණය, නර්තන නිර්මාණය, රංග වස්ත්‍ර නිර්මාණය නැවුම්ම අද්දැකීමක් බවට පත්කිරීම මට අභියෝගයක් වුනා. ඒත් දස වසරක නර්තන පාසැලේ අද්දැකීම් මගේ අභිලාෂය පොහොසත් කළා. මට තිබුන විශාලම අභියෝගය ප්‍රේක්ෂකයි න් ආනන්දයෙන් ප්‍රඥාවට ගෙන යාමට නර්තනය කොයි ආකරයෙන් භාවිතා කරන්නෙද කියන එක. මේ ප්‍රසංගය නැරඹන හැමෝටම මගේ භාවිතය කොයිතරම් දුරට ජයගෙන තිබෙනවාද කියල අවබෝධ කරගන්න පුළුවන් වේවි.

ප්‍රසංගයේ සාර්ථකත්වයට උරදෙන මගේ දයාබර දෙමාපියන්, මගේ ආදරණීය සිසුවියන්ගේ ධෛර්ය කැපවීම වගේම මේ ප්‍රසංගය නැරඹීමෙන් අප දිරිගන්වන ප්‍රේක්ෂකයින්ද මගේ අභියෝගය ජයගැනීමට උදව් වෙන අය.

**ප්‍රසංගය නරඹන්න බලාපොරොත්තුව සිටින අයට, නර්තනය හැදෑරීමට බලාපොරොත්තුව සිටින අයට ඔබ දෙන පණිවුඩය.**

මෙය නැරඹීමට අප්‍රේල් 18 සවස 6.00 බේසින් සෙන්ටර් රංග ශාලාවට පැමිණෙන්න කියා මම ආරාධනා කරනවා. 0411 646695, සහ 0424 311656 අංකයට ඇමතීමෙන් ඔබට ප්‍රවේශපත් ලබාගැනීමට හැකියාව තිබෙනවා. ප්‍රසංගයෙන් අනතුරුව නව පංති වාරය 2015 මැයි මාසයේ ආරම්භ කරන බැවින්. නර්තනය හැදෑරීමට බලාපොරොත්තු වන අයට ඊට සම්බන්ධ විය හැකියි.

ඔබටත් ලාංකීය නර්තනය හා බැඳුන ලොබක් ඇති, මන්ද එය හුදු නර්තනයක් පමණක් නොවේ. එහි ලෙලෙන්නේ අපගේ ආත්මීය භාෂණයයි. නොරට පැමිණ අපේ කමට ලොබ නොබඳින්නෝ කවුරුද. ඔබටත් හැකියි ඇගේ අමා දහර නර්තන ප්‍රසංගය නරඹා තුටු පහටු වීමට. මේ ඒ සඳහා වන හොඳම ඇරයුමයි.

අමාගේ නර්තනය දස වසක් මෙන්ම, මා 'සන්නස'ට සම්බන්ධවීත් දසවසක්. එයද සතුටක්.මේ දසවසර තුල මෙල්බන් නුවරවාසි බොහෝ කලා ශිල්පීන් පිළිබඳ සටහන් සන්නසේ තැන්පත් කළෙමි ඒ සියලු සහෘදයන් ව නැවත මතක් කරමින් මා සමග මෙතෙක් කලක් රැඳී සිටි ඔබට ආයුබෝවේ වා




විසිහතර පැයේම ඔබ වෙනුවෙන් - තිසර ගුවන්විදුලිය www.thisara.com